

ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත

LP - QD / 21/ News/ 2012



# ළමා ප්‍රදීපය

ක්‍රි. ව. 2012 මැයි 07 සඳුදා
04 වෙළුම - 28 කලඹ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු. 10.00



## මැයි මාසය මල් මාසය

## කුමරි මරියාවන්ගේ මාසයයි

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - **2695984 / 4899611**
ෆැක්ස් : 2692586 - ඊ-මේල් **pradeepaya@yahoo.com**
වෙබ් අඩවිය - **www.colombocatholicpress.lk**

# මල් මාසයේ සමරන මල් කුමාරිය

## ආදරණීය දුවේ පුතේ...

මැයි මාසය මල් මාසයයි. මල් මාසය මැයි මාසයයි. මේ මල් මාසය දේව මාතාවන් වෙනුවෙන් කැපවුණු විශේෂ මාසයයි. ඔබ දන්නවා නේද මැයි මාසයේ මල් ගස්වල කෙතරම් මල් පිපෙනවාද කියලා? දේවස්ථානය වත්තේ මැයි ගස්වල මැයි මල් පිපිලා පිරී ඉතිරී යනවා. මේ මැයි මල් වලින් හදන කුඩා පුදසුන මත දේව මාතා ප්‍රතිමාව තබලා මැයි මාසය පුරාම දේව මාතා භක්ති අභ්‍යාස සිදු කිරීම පෙර කල පටන්ම පැවත ආ ඉතා වටිනා සරල යාච්ඤා අත්දැකීමක්.

ආදර දුවේ පුතේ

යාච්ඤා, නුවාන , ජපමාලය වැනි භක්ති අභ්‍යාස වලට මෙම මාසය තුළදී විශේෂ තැනක් ලබා දෙන්නේ ඵල බර ජීවිත අත් දැකීම් වලට පරිසරයෙ තිබෙන විචිත්‍ර සොභාවත් ලං කරවන්නටයි. මැයි මාසයට ස්වභාව ධර්මයා විසින් අමුතුම පණක්, ප්‍රබෝධයක් නැවුම් සිසිලක් ලබා දෙනවා. මුලු පරිසරයම මලින් බරවුණු මෙම කාලයේදී විවිධ වර්ගවල කුරුල්ලන් පවා එහේ මෙහේ පියඹා යන ආකාරය දැක ගන්න පුළුවනි. මේ මාසය පුරාම රැඳී පවතින්නේ අසීමිත සිසිලසක දැවැටුනු ආධ්‍යාත්මික පිබිදීමක්. සෑම දේවස්ථානයකම මේ කාලය තුළදී එකමුතු භක්ති යැදුම් මෙහෙයන් සංවිධානය කරනු ලබනවා. හවසට මීසම් සංඝයේ බොහෝ දෙනෙක් හවුල් ජපමාලය උච්චාරණය කරන්නට දෙව් මැඳුරට එකතු වෙනවා. මරිය හමුදාව, දේව මාතා දරු සමාගම වැනි දරුවන්ගේ මරිය බැතිය වඩවන සමිති සමාගම් මේ මාසය තුළදී පවුලේ ජපමාලය, කුඩා කිතුනු සංඝ වල හවුල් ජපමාලය උච්චාරණය කරන්නට සෑම සියලු දෙනාවම දිරි ගන්වනවා දැක බලා ගන්නටත් පුළුවනි.

මල් නුවානය අනිවාර්යයෙන්ම මෙම මාසය තුළදී පවුල් තුළ හා මීසම් තුළ සංවිධානය වන්නට ඕනෑ. අවාසනාවකට අද සමහර පවුල් වලින් හා දේවස්ථාන වලින් මෙම මල් නුවානය ගිලිහෙමින් පවතිනවා. දේව මාතා ප්‍රතිමාව ගම වටා ගොස් සෑම පවුලක්ම යාච්ඤාවට හා ජපමාල උච්චාරණයට එක්කාසු කළ යුතුයි.

ආදර දුවේ පුතේ, මෙම දේව මාතා භක්ති ව්‍යායාමයේ මල් නුවානය කෙතරම් ලස්සනට ගෙදර පවුලේ අත් දකින්නට පුළුවන්ද? ගෙදර තිබෙන මල් ගස් වලින් මල් නෙලාගෙන ඇවිල්ලා පුංචි ඔබට පුළුවන් ගෙදර ම කුඩා පුදසුනක් නිර්මාණය කරන්න. දේව මාතා ප්‍රතිමාවක් එහි සිංහාසනාරූඪ කරලා ඒ පුදසුනත්, දේව මාතා ප්‍රතිමාවත් සරසන්න. මල් වැල් ගොතලා ප්‍රතිමාව සරසන්න. පුංචි ඔබ එකතු වන විට එතැන ලස්සනට සහයෝගිතාව ගොඩ නැගෙනවා. පොඩි පහනක් දල්වලා ඒ ලස්සන කුඩා පුදසුන අභියස ඔබට පිළිවන් මල් නොවානය සමරන්නට. ඒ වගේම පුංචි ඔබේ මුවින් දේව මාතාවන්ට ගැයෙන සරල ගීතිකා වැඩිහිටියන් ශ්‍රවණය කරන කොට ඒ අයටත් තමන්ගේ ළමා කාලයේදී මල් මාසය සමරපු අයුරු අනිවාර්යයෙන්ම මතක් වේවි. ආදර දුවේ පුතේ, දේව මාතාවන්ට අප විසින් පෙන්වන ගෞරවය දැන් මුළු මහත් ලෝකය පුරාම අලුත් මගක් අනුව වැඩි දියුණු වෙමින් පවතිනවා. දේව පුත්‍රයාණන්ව ලෝකයට බිහි කරමින්, ඇය එතුමන්ගේ පමණක් නොව මුළු මහත් ලෝකයේම විශ්වාසයේ දරු කැලගෙ ආදරවන්ත මෑණියන් බවට පත්වන්නේ ඒ ආදරය වැඩි වර්ධනය කරන්නටයි.

''ස්වාමිනි, ඔබවහන්සේ කැමති ලෙස මට සිදුවේවා'' යි පවසමින් ඇගේ බැහැපත්කම හා දේව අණට කීකරු වීමේ සැබෑ උතුම්කම අප සැමටම ආදර්ශයක් විශේෂයෙන් ලබා දුන්නා. ඒ අනුව මුළු මහත් ශුද්ධවු සභාවටම ඇගේ ආදරයත්, ආශිර්වාදයත්, මැදහත් බවත් නොඅඩුවම ලැබෙන බව විශ්වාසයෙන්ම දැන ගන්නට ඕනෑ. කුඩා කාලයේ පටන්ම පවුලේ ජපමාලයට පුංචි ඔබ හවුල් වෙන්නටම අවශ්‍යයි. අප දෙමව්පියන් තම දරුවන්ගේ ආධ්‍යාත්ම ජීවිතය අරබයා මෙම භක්ති අභ්‍යාසයන් වලට දරුවන්ව යොමු කරන්නට ඉතාමත් අවශ්‍යයි. දේව මාතාවන්ට ගැරහුම් කරන්නාට ජේසු සමිඳුන්ගේ අනුගාමිකයෙක් වන්නට බැහැ. දේව මාතා ප්‍රතිමාවට නිගරු කරන්නා තම අම්මාටත් අවමන් කරනවා, දේව මෑණියන්ගේ ආදරය හා ලෙන්ගතුකම අත් දකින්නට බැරි දරුවන්ට තමන්ගේ අම්මාටත් ආදරය කරන්න බැහැ. ආදර දුවේ පුතේ අද විවිධ ආගමික කණ්ඩායම් අප අතරට එන්නේ, දේව මාතාවන්ට අගෞරව හා අපහාස කරමින්. එහෙම කිරිමෙන් ඒ අය වක්‍රව අපට පවසන්නේ අප අම්මා වරුන්ටත් අගෞරව, අපහාස කරන්න කියලා නේද?

කතෝලික දරුවා අනිවාර්යයෙන්ම දේව අම්මාගේ පහස ලබන දරුවෙක් වෙන්නටම අවශ්‍යයි. දේව මෑණියන් දර්ශනය වු සෑම මොහොතකම එතුමිය ඉල්ලා සිටියේ ජපමාලය උච්චාරණය කරන ලෙසයි. ඒ භක්තිය තුළ ඇය අපව ආදරයෙන් වැළඳ ගන්නවා. ආරක්ෂා කරනවා.

එසේනම් ආදර දුවේ පුතේ, මේ මල් මාසය තුළදී විශේෂයෙන් ජපමාලයේ භක්ති අභ්‍යාසය තුළින් අපි පවුලක් වී කුඩා සංඝයන් වී මල් නුවානය හා සමගින් කතෝලික සසුන තවතවත් වර්ධනය කරන්නට, ආදරයෙන් පුරවාලන්නට වැය වෙමු, කැප වෙමු.

**මල් කුමාරිය දේව අම්මා තුළ ඔබට නිති රැකවරණය වේවා !**

ඔබ සැමට ජේසු පිහිටයි !

සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# මුද්දර ලෝකය



# හඳුනා ගනිමු

**ඉදිරිපත් කිරීම :- සිරිල් පෙරේරා - මල්කඩුවාව**

ගුවන් විදුලියේ හෝ රූපවාහිනියේ ප්‍රශ්නෝත්තර වැඩසටහනක් - ගායනා තරග වැඩසටහනක් හෝ වෙනත් සම්මුඛ සාකච්ඡාවකදී එයට සහභාගි වන්නාගේ නම, ගම, ඇසුවාට පසු නිරන්තරයෙන්ම අසන ඊළඟ ප්‍රශ්නය වනුයේ ''ඔබේ විනෝදාංශය කුමක් ද?'' කියාය.

එයින් පෙන්නුම් කරන්නේ නම, ගම, වගේ ම පුද්ගලයකුගේ අනන්‍යතාවය දැක්වෙන තවත් එක් අංශයක් වන්නේ විනෝදාංශය බවයි. සමහරකුගේ විනෝදාංශය රූපවාහිනී බැලීම, ගුවන් විදුලියට සවන් දීම පොත් කියවීම , මල් වැවීම , මිතුරු මිතුරියන් ඇසුරු කිරීම වගේ ම මිතුරු මිතුරියන් සමග දබරවීමත් වෙන්න පුළුවනි.

නමුත් ළමා විය, තරුණ විය මෙන් ම වැඩිහිටි වියට පැමිණියාට පසුවත් විනෝදාංශයක් ලෙස මුද්දර එකතුකරන අය බොහොමයක් අප අතර සිටිනවා. එය වයසට යන්නේ නෑ. වයස බලපාන්නේ නෑ අද පාසල් යන ළමුන්ගෙන් බහුතරයක් තමන්ගේ විනෝදාංශය ලෙස තෝරාගෙන ඇත්තේ මුද්දර එකතු කිරීම කියලා කිව්වොත් මං කියන්නේ බොරුවක් නෙමෙයි කියලා මං හිතනවා. සමහර ශ්‍රේණිවල පාඩම් පොත්වල මුද්දර එකතුකිරීමේ දී අත්වන දැනුම පිළිබඳ පාඩම් ඇතුළත් කර තිබෙනවා, මුද්දර පිළිබඳ ගවේෂනාත්මක නිබන්ධන සකස් කිරීමට උනන්දු කිරීම, සමහර පාසල්වල මුද්දර සමාජ පිහිටුවීම, මුද්දර ප්‍රදර්ශන පැවැත්වීම යනාදියෙන් සිසු සිසුවියන් අතර මුද්දර එකතුව ප්‍රචලිත කර තිබෙනවා.

මුද්දර එකතු කිරීම හුදෙක් ම විනෝදාංශයක් පමණක් නොවේ. එමගින් පරිණත අධ්‍යාපන දැනුම, සකසුරුවම, ශික්ෂණය ක්‍රමවත්බව , ඉවසීම , සිත්ශාන්තිය, කලා රුචිකත්වය, සොබා සෞන්දර්යට ඇල්ම , පිරිසිදු බව, ගවේෂණශීලිත්වය මෙන් ම ධන ආයෝජන- යක් ද වේ. තව ද ඒකාකාරී විනෝදාංශයක් නොවන දිනෙන් දින දැනුම අලුත් කරන සජීවී ගුණාංගයක් ඒ තුළ ඇත. විශ්ව කෝෂයකින් හෝ අන්තර් ජාලයකින් ලබා ගන්නා දැනුම් සම්භාරයකට නොදෙවෙනි දැනුමක් එයින් ලබාගත හැක.

අද අන්තර්ජාලය මගින් මුද්දර පිළිබඳ තොරතුරු දත්ත රැගත් වෙබ් අඩවි දස දහසකි. මුද්දර එකතුකිරීම ලොවේ ජනප්‍රිය ම විනෝදාංශය වී ඇති බවට එයම ප්‍රබල සාක්ෂියකි.

රටක ජාතික අභිමානය, සංස්කෘතිය, සොබා සෞන්දර්යය විදහාපාන පහසුම ක්‍රමය ලෙස යොදාගනුයේ මුද්දරයයි. එමගින් සාමයේ, සමාදානයේ, පරිසරයේ, පණිවිඩය රටින් රටට ගෙන යන නිල නොලත් තානාපති වරයකුගේ කාර්යභාරය ඉටු කරයි. ස්වාධීන රටකට, දේශයකට අනන්‍ය වු පුද්ගලයෙක්, ස්ථානයක්, උත්සවයක්, සිහි වටනයක්, සැමරුමක් ලොව පුරා සන්නි වේදනය කිරීමේ ප්‍රබල හැකියාව කුඩා කඩදාසි කැබැල්ලක් බඳු පුංචි මුද්දරයකට තිබීම පුදුම එළවන සුළුය.

> *රටක ජාතික අභිමානය, සංස්කෘතිය, සොබා සෞන්දර්යය විදහාපාන පහසුම ක්‍රමය ලෙස යොදාගනුයේ මුද්දරයයි. එමගින් සාමයේ, සමාදානයේ, පරිසරයේ, පණිවිඩය රටින් රටට ගෙන යන නිල නොලත් තානාපතිවරයකුගේ කාර්යභාරය ඉටු කරයි. ස්වාධීන රටකට, දේශයකට අනන්‍ය වු පුද්ගලයෙක් , ස්ථානයක් , උත්සවයක්, සිහිවටනයක්, සැමරුමක් ලොව පුරා සන්නිවේදනය කිරීමේ ප්‍රබල හැකියාව කුඩා කඩදාසි කැබැල්ලක් බඳු පුංචි මුද්දරයකට තිබීම පුදුම එළවන සුළුය*

අඩුම වියදමකින් ජනතාව අතර සන්නිවේදන සේවාව සැපයීමට තැපැල් සේවය ආරම්භ වූයේ පුංචි මුද්දරයකට පිං සිද්ධ වෙන්නයි. ''විනෝදාංශයේ රජ හෙවත් රජවරුන්ගේ විනෝදාංශය යන විරුදාවලිය අනුව මුද්දර විනෝදාංශයේපෙළපොත්වලපවා විනෝදාංශයට මුද්දර එකතු කරන්නෝ දක්නට ලැබුණි. ඒ අතර පස්වන ජෝර්ජ් රජු වඩාත් ප්‍රසිද්ධය.

සැප්තැම්බර් මාසය සාහිත්‍ය මාසය ලෙස පිළි ගැනෙන්නේ යම් සේ ද, එලෙස ම ඔක්තෝබර් මාසය සැලකෙන්නේ ජාතික කියවීම් මාසය මෙන් ම ජාත්‍යන්තර මුද්දර එකතු කරන්නන්ගේ මාසය ලෙසයි.

යුරෝපීය රටවල් කිහිපයක 15 වන සියවසේ දී තැපැල් සේවාව ආරම්භ වී තිබුණත් ලොව ප්‍රථම තැපැල් මුද්දරය නිකුත් කළ දිනය ලෙස සැලකෙන්නේ 1840 මැයි මස 06 වන දිනයයි. එවකට එංගලන්තයේ කිරුළ හිමි වික්ටෝරියා රැජිණගේ සිරසේ පැති රූපයකින් සමන්විත කළු පැහැති පැන්ස එකක වටිනාකමින් යුතු මුද්දරයකි එය. එම නිසා ම එම මුද්දරය ''පෙනි බ්ලැක්'' යන අන්වර්ත නාමය මුද්දර ලෝලීන් අතර ප්‍රචලිත වුවා පමණක් නොව මුද්දර වෙළඳ පොළෙහි ඉහළ වටිනාකමක් ද හිමි කරගෙන ඇත.

ඉදිරි කලාපයන් වලට

# මව්වරුන්ගේ දිනය නිමිත්තෙනි.

## ආදරයේ උල්පත වූ අම්මා ....

ළමා මනස තුළ ලොව පුරා විහිදි සංවේදී ජීවමාන වචනයකි ''අම්මා''. සැම වර්ෂයකම මැයි මස 08 වන දිනට යෙදී තිබෙන මව්වරුන්ගේ දිනය පෙරටුකොට ගනිමින් මව්ගුණ සිහිපත් කිරීමේ අදහසින් මම මෙසේ ලියන්නට සිතුවෙමි. දස මසක් කුසදරා අනේකවිද දුක් විඳිමින් අප්‍රමාණ දරු සෙනහසක් සිත්හී නිධන්කර ගනිමින් අම්මා අපව ලොවට දායාද කරයි. ඔබත් , මමත් ලොව එළිය දුටු දා පටන් මව් ඇකයේ පහස විඳිමින් උතුම් වූ මව් සෙනෙහස ලැබ ගන්නට වාසනාවන්ත වුවා නොවේද? අපට අමිල සෙනෙහසක් දැක්වූ ක්‍රිස්තුන් වහන්සේ අප වෙනුවෙන් තම රුධිරය පවා පුජා කරන ලදි. එසේම ලේ කිරිකර පොවා අපට ජීවය දී අමිල සෙනෙහසකින් අප දෝවනය කළ මවද ලොව උතුම් අයෙකු වන්නේය. එවන් උතුම් මව්වරුනට උපහාර පිදීමට, ආදරය, කරුණාව දැක්වීමට හා කළගුණ සැලකීමට එක් දිනයක් වෙන් කොට නියම කළ නොහැක. නමුදු මැයි මස 08 වන දිනය ''මව්වරුන්ගේ දිනය '' යැයි නම් කර තිබීම අගය කළ යුතුම කරුණකි. ආදරණීය නංගියේ , මල්ලියේ මව් දිනයට පමණක්ම නොව ඔබේ මවට නිරතුරුවම ආදරය කිරීමට, කළ ගුණ සැලකීමට උත්සුක වන්න.



අපට සාගරය සේ ආදරය කරන අම්මාහට අපිත් එසේම ආදරය කරමු. පුංචි අපිට අම්මහට ආදරය කළ හැක්කේ කෙසේද? මව් සිත නොරිදවා මවගේ ඔවදන් වලට නිතරම කීකරුව, හොඳින් ඉගෙන ගනිමින් මවගේ බලාපොරොත්තු ඉටු කරන්නට දැඩිව අදිටන් කර ගන්න නැණවත් හා ගුණවත් දේව දරුවකු වන්න.

බොජුන් දී රස කර<br>
සොඳින් නාවා නිදි කර<br>
පෙමින් සුරතල් කර<br>
මවුන් වැඩු අපි වඳිමු හැම වර

''දෙගුරු ගුණ මහිමය'' නම් උපදේශාත්මක පද්‍යයෙහි එන මෙම පද පෙළ මෙන්ම කවි, ගී රැසක් මව් ගුණ පිළිබඳව රචනා වී ඇති අතර ගායක, ගායිකාවන් බොහෝ පිරිසකගේ ගීත සංග්‍රහ අතරට මව්ගුණ වරුණ ගීත ඇතුළත්වීම ද අතිශය සතුටට කරුණකි. ඉතා විශිෂ්ට ගණයේ ග්‍රන්ථ අතරට එක් වූ මැක්සිම් ගෝර්කි යන දක්ෂ රචකයාගේ ''අම්මා '' යන නව කතාව මව් ගුණ ඇතුළත් කර ලියැවුනු කෘති අතර අති ශ්‍රේෂ්ඨ ගණයේ කදිම නිදසුනකි. නංගී, මල්ලී දෙවිඳුන්ට පමණක් දෙවැනි වන ''අම්මා'' නැමදීමට අමතක නොකරන ලෙස මම පුංචි ඔයාලගෙන් ඉල්ලා සිටින්නෙමි. ඔබේ පාසලේ දහම් පාසලේ ගුරු මෑණියන්ට ද තම මවට මෙන්ම ගරු කළ යුතුය. දහසක් දරුවන්ට මව් වන්නට වරම් ලද ඔබේ ගුරු මව්වරුන්ද උතුම් කොට සලකන්න. ගුණදම් හුරු කරමින්, නැණ නුවන් පහදාලමින් අප දිවි මාවතට එළියක් වන්නට කැප වී සිටින ගුරුමව්වරුන් පිදීමට පුරුදු වන්න. සමාජයේ ඔබට හමුවන සැම කාන්තාවකටම ඔබේ මවට මෙන්ම ගරු කරන්නට ඔබට හැකිනම් ඔබ දෙවිඳුන් ඉදිරියේ ප්‍රසන්න දේව දරුවකු වන්නේය. මරිය තුමිය මුළු ලොවටම හිමි අප සැමගේ මෑණියන් වූ හෙයින් මරිමව් ආසිරි ලැබ ගනිමින්, එතුමියගේ මැදිහත් පිහිට නිතර අයදින්නට පුරුදු වන්න.

ඔබ ඉපදී හැදී වැඩුණු මෙම දීපය ඔබේ මවයි. එහෙයින් මව්බිමට ආදරය කරන, මව්බිම සුරකින දේශප්‍රේමී පුද්ගලයකු වන්න. මිහිකත් මව වන සොබාවධර්මයටද එසේම ලැදි වන්න. එසේ ''මව'' යන නාමයට හිස නමා ආදරය කරන ගුණවත් ආදර්ශමත් අයකු වන්නට ඔබටත් මටත් හැකි වේවා යි පතමි.

**අචිනි කෞශල්‍යා නිලුක්ෂි**<br>
**2011 - සා.පෙළ**<br>
**හලා/ කාර්මේල් බාලිකා ම.ම.වි**

**මාසික සිතිවිල්ල**

මෙහි පළවන සේයාරුවට ගැලපෙන පරිදි ඔබගේ අලංකාර ගද්‍ය හා පද්‍ය නිර්මාණය අප වෙත යොමු කරන්න. ඔබ එවන නිර්මාණය සමග ඔබේ නම, ලිපිනය, ශ්‍රේණිය, පාසල, දහම් පාසල හා දුරකථන අංකය ද පැහැදිලිව ලියා පහත ලිපිනයට යොමු කරන්න.



**මාසික සිතිවිල්ල**<br>
''අප්‍රේල් මාසය''<br>
ළමා ප්‍රදීපය, අංක 02,<br>
ඥානාර්ථ ප්‍රදීපය මාවත,<br>
කොළඹ 08.

**මාසික සිතිවිල්ල ජයග්‍රාහී නිර්මාණය ලබන සතියේ පළ කෙරේ**

# කොටහේන යහපත් එඬේරා ප්‍රාථමිකයේ මලල ක්‍රීඩා ශූරියක්



කොටහේන යහපත් එඬේරාගේ කන්‍යාරාමයේ ප්‍රාථමික අංශයේ 5 වන ශ්‍රේණියේ ඉගෙනුම් ලබන අනුෂ්කා හේවාගේ ශිෂ්‍යාව අධ්‍යාපන කටයුතු වලට මෙන්ම ක්‍රීඩාවටද ඉතා උනන්දුවක් දක්වන දක්ෂ ශිෂ්‍යාවකි. මේ වසරේ පැවති උතුරු කොළඹ කොට්ඨාස පාසල් ක්‍රීඩා 2012 තරගයේ උස පැනීම , දුර පැනීම හා මීටර් 100 ධාවන තරග වලින් ප්‍රථම ස්ථානය දිනා ගනිමින් උතුරු කොළඹ කොට්ඨාස පාසල් ක්‍රීඩා අවුරුදු 11 පහළ දක්ෂතම ක්‍රීඩිකාව ලෙස තම පාසලට ඉමහත් කීර්තියක් ලබා දුන් දිදුලන තාරකාවියකි.

**( ලක්ෂිකා ද මෙල් )**

# මීගමුව ආවේ මරියා කන්‍යාරාමයේ සිසුවියක් ලෝක චෙස් ශ්‍රේණිගත ක්‍රීඩාවන් අතරට

මීගමුව ආවේ මරියා කන්‍යාරාමයේ 7 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන පී. ඒ රොලින්කා රුෂ්මාලී නෝනිස් සිසුවිය චෙස් ක්‍රීඩාවට උසස් දස්කම් දක්වන අයෙකි. ලෝක චෙස් ශ්‍රේණිගත ක්‍රීඩිකාවක් ලෙස තේරී පත්වී සිටින ඇය තම ඉගෙනීම ලබන පාසලට මෙන්ම දළුපත මීසමට අයත් ආරෝග්‍යා දේව මාතා දහම් පාසලටද විශාල කීර්තියක් ලබා දී ඇත.

2007 වසරේ ඇය සහභාගිවූ ප්‍රථම තරගාවලියෙන් (ගම්පහ දිස්ත්‍රික්) ශූරතාව දිනාගත් මෙම සිසුවිය 2008, 2009 , 2010 වසරවලද නොකඩවා ගම්පහ දිස්ත්‍රික් ශූරතාව දිනාගෙන ඇත. 2012 වසරේදී අවුරුදු 10 න් පහළ සමස්ත ලංකා ශූරතාවද ඇය දිනාගෙන තිබේ. එම වසරේදී චීනයේ බීජින් නුවර පැවති ආසියානු චෙස් තරගාවලිය සහ ග්‍රීසියේ අගනුවර පැවති ලෝක ශූරතා තරගාවලියේ නිල ක්‍රීඩිකාව ලෙස සහභාගි වූවාය. මීගමුව ක්වීන්ස් චෙස් සංගමයේ සභාපතිනි සනෝජා පෙරේරා චෙස් ගුරුතුමිය ඇයට මේ දක්වා චෙස් ක්‍රීඩාවේ දස්කම් දැක්වීමට අවශ්‍ය පුහුණුව හා උදව් උපකාර කර ඇත.

මීගමුවේ මාරිස්ටෙලා විදුහලේ 9 ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඇයගේ සොහොයුරු පී එස්. සිත්මාල් නෝනිස් ලෝක චෙස් ශ්‍රේණිගත ක්‍රීඩකයෙකි. චෙස් ක්‍රීඩාවෙන් ආවේමරියා කන්‍යාරාමයට ජයග්‍රහණ රැසක් හිමිකර දී ඇති රොලින්කා නෝනිස් ශිෂ්‍යාව පාසලේ ඉගනීමේ කටයුතු වලදීද විශේෂ දක්ෂතා දක්වයි

**රේමන් අපෝන්සු**



# තුඩැල්ල ක්‍රිස්තුරාජ විදුහලට පාපන්දු ශූරතාවයක්



2012 වසරේ මීගමුව කලාපයේ 17 න් පහල පාපන්දු ශූරතාවය මෙවර තුඩැල්ල ක්‍රිස්තුරාජ ජාතික පාසල විසින් දිනා ගන්නා ලදි. ජයග්‍රාහි කණ්ඩායම විදුහල්පති ගරු නිහාල් රුද්‍රිගු පියතුමා ෂරිරු සහෝදර තුමා - ක්‍රීඩා පුහුණු කරු වන අනුර සිල්වා මහතා ක්‍රීඩා භාර ආචාර්ය ජැක්සන් ජයලත් මහතා හා ක්‍රීඩා භාර ආචාරිණි කමනි මෙනවිය සමග ළමා ප්‍රදිප කැමරාවට මුහුණ දුන් අයුරු.

**ලෙස්ලි පෙරේරා**

# 2012 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

**(පසුගිය සතිය හා සබැඳේ)**

**දේව ප්‍රසාද නිධානයක් වීමට අවශ්‍ය මූල ධාතු කවරේද?**

★ ප්‍රසාද නිධාන සඳහා භාවිත වන ද්‍රව්‍යය.

ද්‍රව්‍ය යනුවෙන් අදහස් කරනු ලබන්නේ ඒ සඳහා උපයෝගී කරගන්නා ජලය, තෙල්, පූප මිදිරස වැනි ද්‍රව්‍ය වේ.

★ සලකුණු පැහැදිලි කෙරෙන රූපය හා එය දානය කරන්නා.

මෙයින් අදහස් කරන්නේ ප්‍රසාද නිධානයේ අර්ථය හෙවත් එයින් සලකුණු කෙරෙන දේ ප්‍රත්‍යක්ෂ කරදීමට යොදන වචන මාලාවයි.

**දේව ප්‍රසාද නිධානයක් වීමට බලපාන සාධක කවරේ ද?**

★ <u>බාහිර ලක්ෂණ</u>

ඉන්ද්‍රිය ගෝචර එනම් , මිනිස් ජීවිතයට ඉතා සමීප දේ , යාච්ඤා ( වචන) උපයෝගී කරගන්නා ද්‍රව්‍ය : ජලය /තෙල්/ පූප / මිදිරස

★ <u>අභ්‍යන්තර වරප්‍රසාදය</u>

බාහිර සලකුණුවලින් ප්‍රකාශ වන අභ්‍යන්තර වරප්‍රසාද
උදා: ජලය වත්කිරීම , පවිත්‍රත්වයේ සංකේතයකි. ක්‍රිස්තුන් වහන්සේ තුළ නව ජීවනයක් ලැබීම

★ <u>ජේසුස් වහන්සේ විසින් ස්ථාපිත කර තිබීම.</u>

ලෙඩුන් සුවකිරීම , ගෝලයනට බලය පැවරීම , අන්තිම රාත්‍රී භෝජනය, පව් සමාව යනාදිය උදාහරණ ලෙස ගත හැකිය.

( එදා මෙන් අදත් ජේසුස් වහන්සේ අප අතර සිටිමින් අප පණ ගන්වන බව තහවුරු කරනුයේ විශේෂාකාරයෙන් අපට දානය කරන මෙම ප්‍රසාද නිධාන මගිනි. එහෙයින් ප්‍රසාද නිධාන තුළ ක්‍රියාකාරී වන්නේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ය. )

<u>සෑම ප්‍රසාද නිධානයක්ම ක්‍රිස්තු කේන්ද්‍රියයි.</u>

*සෑම ප්‍රසාද නිධානයක්ම දානය කරනු ලබන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ නාම යෝජනයෙන් ය. මේවා තුළින් ක්‍රියාකාරී වන්නේ ද උන්වහන්සේය. ශුද්ධාත්ම බලය හෙවත් දේව වරප්‍රසාද ජනිත වනුයේ ඒ හෙයිනි.*

**දේව ප්‍රසාද නිධානවල අරමුණ කවරේද ?**

- ශුද්ධවූ සභාවේ සාමාජිකයකු වශයෙන් ආත්මික ජීවිතය තුළ වර්ධනයක් ලැබ පූර්ණත්වය කරා ගෙන යනු ලැබීම.
- මනුෂ්‍යයන් ශුද්ධවත් කිරීම .
- ක්‍රිස්තු දේහය නඟාලීම
- දෙවියන් වහන්සේට වන්දනාමාන පිදීම
- ජීවිත මාරුවක් ඇති කිරීම ( ජන වන්දනාව පිළිබඳ ව්‍යවස්ථාව - අංක 59)

**කිතුනුවකුගේ ස්වභාවික ජීවිතයේ පියවර හා අධ්‍යාත්මික ජීවිතයේ පියවර අතර , සමානකමක් ඇති බව පවසන්නේ කුමන ග්‍රන්ථයේද ?**

★ කතෝලික සභා ධර්මෝපදේශය (අංක 1210)

ගරු ඩේමියන් පෙරේරා පියතුමා




# කඩදාසි ඔරුවක්

නියඟයට අසුවී , කෙඬැරී වී ගිය ගස් කොළන් වැහි බිඳු සිප ගැනීමෙන් පසු, නව පණක් ලද්දවුන් මෙන් සීතල නළ වැලේ නැළවෙයි. මොහොතකට පෙර සුළු වශයෙන් පටන් ගත් වැ-ස්ස, දැන් බොහෝ තදින් වසී. වහලය මතට වැටෙන වතුර, පීල්ල දිගේ ගලාවිත් මිදුල පියමං කර වේගයෙන් වත්ත පහළට ඇදී යයි.

''අක්කේ ..... මට කඩදහි ඔරුවක් හදලා දෙන්නකෝ'' පරණ ඇක්සයිස් පොතක් අතැතිව සිටි රුවන් මල්ලී මා හට ඇරයුම් කළේය.

''කඩදහි ඔරු, ඇරිය වගේ නෙමෙයි. මේ වැස්සට තෙමිලා ඔයා ලෙඩ වුනොත් ... මට තමයි අම්මගෙන් බැනුම්. ඊට වැඩිය හොඳයි කාමරේට ගිහින් පාඩම් පොතක් බලාගන්න ''

මා මෙසේ පවසද්දී මල්ලීගේ මුහුණ දුකින් බර වෙන්නට විය. දෙනෙත් තුළින් රිදීපාට කඳුළු බිඳු දෙකක් පිටවී, දෙකොපුල් දිගේ ගලායන්නට විය, ඔහුගේ මුහුණින් අනුකම් පාව හා බයාදු බව උතුරා යයි. කඳුළු පිරි දෙනෙතින් මොහොතක් මා දෙස බලා සිටි මල්ලී, ''අනේ අක්කේ ....'' යයි හැඬුම්බර , වෙව්ලන සිඟිති දෙතොල් පොපියවා මිමුණුවේය.

මල්ලී කෙරෙහි මසිතේ දැඩි අනු කම්පාවක් උපදිනි. ආදරය හා අනුකම්පාව උතුරන ඔහුගේ පුංචි තිල්පාට ඇස් දෙක බලාගෙන මට තවත් ඔහුගේ කීමට පිටු පෑමට නොහැකි බවක් දැනින ඔහු අත තිබූ පොතෙන් කොළයක් කඩා ගත් මම, කඩදාසි ඔරුවක් සාද ඔහු අත තැබිමි. මා වෙත කාරුණික සිනහවක් පෑ මල්ලී, එයත් රැගෙන මහත් සතුටින් ස්තෝප්පුවට දිව ගියේය.

මම ජනෙල් කවුළුව අසලට වී රැලි නංවමින් වත්ත පහළට ඇදී යන දිය පහර දෙස බලා සිටිමි. අම්මා කුස්සියේ පොල් ගාන හඬ යාන්තමට දෙසවනට ඇතුළුවෙයි. එක් වරම ස්තෝප්පුව දෙසින් සිහින් කෙඳිරිලි හඬක් නැඟුණෙන් මම වහා එදෙසට දිව ගියෙමි.

''දෙවියනේ'' ගසාගෙන යන දිය පාරේ ඇද වැටී දඟලමින් සිටි රුවන් මල්ලී, දුටු මා මුවින් ඉබේටම පිටවිය. කඩිනමින් එළියට පැන ගත් මම, මල්ලී ඇතින් ගෙනවිත් පුටුක් මත තැබීමි. වතුරේගසා ගෙන ගිය කඩදාසි ඔරුව ගන්නට ගිය මල්ලී ලිස්සා ගොස් බිම වැටී ඇත.

ඔහුගේ නළල පැලී සිහින් ලේ ධාරාවක් ඉන් ගලා යයි. කඩදාසි ඔරුව ගසාගෙන ගොස් වතුරට පෙඟී, කැඩී බිඳී ගොස් තිබුණි.

''අනේ අක්කේ අම්ම මට ගහයිද? ''

වතුරින් පෙඟී, තෙත් වී තිබූ මුහුණ සෝබර කරමින් වේදනාත්මක හඬින් මල්ලී මිමුණුවේය. මල්ලීගේ දුබල වූ, මලානික හඬ මා හද වෙඬරු පිඬක් සේ උණු කරවීය . මල්ලී කෙරෙහි මසිතේ ඉමහත් දුකක් ඇතිවේ.

''නැහැ මල්ලී ... අම්ම ගහන්න ආවොත් මම ඔයාව බේර ගන්නම්, මීට පස්සේ එහෙම වැඩිමල් අය අකමැති දේවල් කරන්න එපා හොඳේ.''

අපහසුවෙන් ගොනු කරගත් වචන මම මල්ලී ඉදිරියේ දිග හැරියෙමි.

වේදනාවත් බියත් අතර තනිවූ රුවන් මල්ලී, මා වෙත වේදනාව තුළින් සතුටුම සිනහවක් පෑවේය..

ඩී. ඩග්ලස් නිමලවංශ



මත්තුමගල දිව්‍යහඳ දෙව්මැඳුරේ ධර්මදූත ළමා සමාජය සංවිධානය මඟින් පැවැත්වූ අලුත් අවුරුදු උත්සවය පසුගිය ද පැවැත්වුණි. මෙයට එක්වූ ළමුන් තරගයට සහභාගීවූ අයුරු

සටහන - කේ.ඩී රුචිරා - සේයා රූ- එච් .ඒ. කල්දේරා

# පාප් කො
# ඔබ මේවා

**ශුද්ධෝත්තම පියතුමාගේ කොඩිය නැතහොත් සසුන්පිය ධජය කුමක්ද කියා ඔබ හඳුනනවාද? එහි ඉතිහාසයත්, ධජයේ ඇති සලකුණු මගින් සංකේත කරන දෑත් ඔබ දන්නවාද? පුංචි ඔබ තබා අපේ වැඩිහිටි අම්මලා , තාත්තලා පවා මේ ගැන හරිහැටි දන්නේ නැති බවක් පෙනේ.**

වර්ෂ 1929 ජුනි 07 වැනිද අති උත්තම නමවැනි පියුස් ශුද්ධෝත්තම පියතුමා ඉතාලියත් සමග අත්සන් තැබූ ලැටරන් ගිවිසුම අනුව ලෝකයේ කුඩාම රාජ්‍ය ය බිහිවිය. එනම් ශුද්ධාසනයේ පාලනය යටතේ පවතින වතිකාන රාජ්‍යය බිහිවිය.



සසුන් පියතුමාගේ පාලනය යටතේ පවතින වතිකානයේ නිල ධජය සසුන් පිය ධජය හෙවත් පාප් කොඩිය ලෙස හැඳින්වේ. වතිකානයේ බලයලත් ප්‍රධාන පුරවැසියා ශුද්ධෝත්තම පියතුමා වන බැවින් වතිකාන ධජය එතුමන්ගේ ද ධජය ලෙස හැඳින්වීමේ වරදක් නැත. එද 1929 දී නිර්මාණය වූ මේ ධජය ඔසොවා තබන ආධාරකය ඇති අර්ධය රන්වන් පැහැයෙන්ද අනික් අර්ධය සුදු පැහැයෙන්ද යුක්තවේ.

සුදු පැහැති අර්ධය මධ්‍යයේ පේදුරු තුමාගේ යතුරු දෙක තබා ඇත. සසුන් පිය කිරීටය (ඔටුන්න) ඊට ඉහළින් ඇත.

යතුරු දෙකින් එකක් රන්වන් පැහැයෙන්ද, අනික රිදී පැහැයෙන්ද දක්වා ඇත. යතුරු දෙක ස්වර්ගීය දොරටු නියෝජනය කරයි. එද ක්‍රිස්තුන් වහන්සේ පේදුරු තුමන්ට වදළ ලෙස "ස්වර්ග රාජ්‍යයේ යතුරු ඔබට දෙන්නෙමි. ඔබ පෙ බඳින්නෙහිද ,එය ස් ලබන්නේය. ඔබ පෙ මුදන්නෙහිද එය ස්ව ලබන්නේ "යයි වදළ 16:19)

පේදුරු තුමන්ගේ අ ශුද්ධෝත්තම පියතු ලෙස යතුරු දෙක පැහැයෙන් යොදු



# ඩිය ගැන දන්නවාද?

ාළොවෙහිදී යමක්
වර්ගයෙහිදී බඳිනු
ාළොවෙහි දී යමක්
ර්ගයේහි දී මුදනු
ෑ සේක. (මතෙව්

නුප්‍රාප්තිකයාණන්වූ
මා සිය සංකේතය
රන්වන් හා රිදී
ගන ඇත්තේ 13

වැනි ශතවර්ෂයේ පටන්ය. මෙහිදී ස්වර්ණ වර්ණ යතුරෙන් ආධ්‍යාත්මික බලයත්, රිදී පැහැති යතුරෙන් වචනයේ බලයත් නිරූපණය කැරේ.

මෙහිදී රන්වන් පැහැය වෙනුවට කහ පැහැය යොදා ගන්නා අවස්ථාද තිබේ. විශේෂයෙන් වංශාවලිය පිළිබඳ නියමයන් මත කහ සහ රන්වන් පැහැය බරපතළ වෙනසක් නැති අතර රිදී පැහැය හා සුදු පැහැයේද එවැන්නක් නැත. මේ අතර රතු පැහැති කඹයකින් මේ යතුරු දෙක සම්බන්ධ කර ඇත.

★ ධජයේ දැක්වෙන ඔටුන්න අති උතුම් නමවැනි පියුස් ශුද්ධෝත්තම පියතුමන් භාවිත කළ ඔටුන්නයි. එහෙත් දැන් ශුද්ධෝත්තම පියතුමා ඔටුන්නක් භාවිත නොකරයි.

සසුන් පිය ධුරාවලියේ ත්‍රිත්වික භාවය ධජයේ ඇති ඔටුන්නෙන් දිස්වේ. මෙම ඔටුන්නේ තට්ටු තුනෙන් ලෝක තුනක් සංකේතවත් කරයි.

එනම් ස්වර්ග රාජ්‍යය, මානව සම්පතින් පිරි මේ ලෝකය හා විනාශයේ දොරටු විවර කරන අපාය නොහොත් නරකාදියයි. මෙය සැබෑ ලෝකයන් ලෙස බෙද වෙන්කර නැතත් සාමාන්‍ය ව්‍යාවහාරය අනුව එසේ සැලකේ.

ස්වර්ග රාජ්‍යය මේ සියල්ල අතර වඩාත් ඉහළම තැන වෙද්දී මෙලෝ තලය එක්තරා මධ්‍යගත නාමයක් ගනී. අපාය හෙවත් නරකාදිය සාතන්ගේ නපුරේ රාජ්‍යය වේ ශුද්ධෝත්තම පියතුමා මිනිස් නියෝජිතයා ලෙස මේ සියල්ල පාලනය කරන බව ඉඟි කරයි.



ඇපලෝ 11 යානය සඳ මත ගොඩ බැස්සූ අවස්ථාවේ ඇමරිකානු කොඩියට අමතරව සසුන් පිය ධජය ද එහි එසැවූ බව සනිටුහන් කරන සිහිවටන පුවරුවයි මේ...

**ශිරාන් මෛත්‍රී**

# ඉංග්‍රීසි පාඩම
## විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

**ඉදිරිපත් කිරීම - මයිකල් ඇන්ජලෝ ප්‍රනාන්දු විසිනි.** **පාඩම් අංක : 52**

## Each and Every

දැන් අපි තවත් ප්‍රයෝජනවත් වචන දෙකක් ගැන දැනුවත් වෙමු. ඒ වචන තමයි **Each** සහ **Every** කියන වචන.

**Each** කියන්නෙත් **Every** කියන්නෙත් ඇත්තෙන්ම එකම තේරුම තියෙන වචන දෙකක්. බොහෝ අවස්ථාවලදී මේ වචන දෙකෙන් කෝක යෙදුවත් එකම අරුත කියවෙනවා.

නිදසුන්
There is a bed in **each** room.
There is a bed in **every** room.
මේ වැකි දෙකෙන්ම කියැවෙන්නේ හැම කාමරයකම ඇඳක් බැගින් තිබෙන බවයි.

**Every** boy had a bicycle
**Each** boy had a bicycle.

මේ වැකි දෙකත් එහෙමයි. දෙකෙන්ම කියැවෙන්නේ හැම පිරිමි ළමයටම බයිසිකලයක් තිබුන බවයි. නමුත් ඇත්තෙන්ම Each සහ Every කියන වචන දෙකේ ඉතා සුළු වෙනසකුත් තියෙනවා.

**Each** කියන වචනෙන් අපි කතා කරන්නෙ කිසියම් පිරිසක්, කට්ටියක්, බොහෝමයක් අතරින් "වරකට එක් අයෙක්, එක් දෙයක්" ගැනයි.

එක් එක් පුද්ගලයා / එක් එක් දේ වෙත වෙන වෙනම අවධානය යොමු කිරීමට Each කියන වචනය යොදා ගන්නවා.

Every කියන වචනෙ ඊට ටිකක් විතර වෙනස් අදහසක් දක්වනවා. යම් පිරිසකින් / දේවල් ගොඩකින් එක්කෙනෙක් ගැන වෙන වෙනම නෙමේ මෙතනදි කතාකරන්නෙ. මුළු පිරිසටම / කට්ටියටම පොදු නමුත් පෞද්ගලිකවත් අවධානය යොමු කිරීම පිණිස Every කියන වචනය යොදා ගැනෙනවා.

Every කියන වචනයෙන් කියැවෙන්නේ. "එක්ක නැර" කියන අදහස.

I know every student in this class.
මම මේ පන්තියෙ හැම සිසුවා ගැනම දන්නවා.
(එක්කෙනෙක් නැර සේරම දෙනා ගැන)

Kamal has read every book in the library.
කමල් පුස්තකාලයේ තිබෙන හැම පොතක්ම කියවල තියෙනවා.

Every person had a hat.
හැම පුද්ගලයකුටම (එකකෙනෙක් නැර) තොප්පියක් තිබුණා.


**Each** කියන එක වගේම **Every** කියන එකත්
**ඒක වචන ස්වරූපයකින් තිබිය යුතු බව මතක තබා ගන්න.**
**Each one** of you **is** a Sri lankan.
(ඊච් වන් ඔෆ් යූ ඉස් අ ශ්‍රී ලංකන්)

**Every one** of you **is** a Sri lankan.
(එව්රි වන් ඔෆ් යූ ඉස් අ ශ්‍රී ලංකන්)
මේ දෙකෙන්ම කියවෙන්නේ
"ඔබලා හැම කෙනෙක්ම ශ්‍රී ලාංකිකයෙක්" කියන අදහසයි.


**Each** one of these shirts **has** broken buttons.
(ඊච් වන් ඔෆ් දීස් ෂර්ට්ස් හැස් බ්‍රෝකන් බට්න්ස්)
මේ හැම කමිසයකම කැඩුනු බොත්තම් ඇත.

# ගැටවර මුළාව

**කර්තෘ - ආචාර්ය දොන් පීටර් පියතුමා**
**මිල - රු. 200**




*මේ කෙටිකතා දහයේම දක්නට ලැබෙන ඉතා සුවිශේෂී ලක්ෂණය ආදර්ශයයි. ළමා චරිත වර්ධනය සඳහා ඉතා වැදගත් මේ ආදර්ශය මගින් ඉටුකළ හැකි මෙහෙවර ඉතා වටනේය. විශේෂයෙන් ළමා පරපුරට එමගින් සිය ජීවිතවලට බොහෝ කරුණු කාරණා එක්කර ගත හැකිය.*




**ශිරාන් මෛත්‍රී**

දූ දරුවන් වෙනුවෙන් පොත පත ලිවීමේ අති සමතකු වූ ස්වර්ගස්ථ අතිගරු ඩබ්ලිව් එල්.ජ් දොන් පීටර් මාහිම්පාණන් විසින් මීට තිස් වසරකට පෙර රචනා කරන ලද ගැටවර මුළාව ළමා කෙටිකතා සංග්‍රහයකි.

ස්වර්ගස්ථ අතිගරු දොන් පීටර් මාහිම්පාණන්ගේ ළමා කෙටිකතා 10 ක් මෙහි අඩංගු වී තිබේ. ගැටවර මුළාව, සතුරකු උදෙසා, අදහමින් බැහැරට, උඩින් හකුරු, පියකුගේ පරිත්‍යාගය, අකටයුත්තට පහර, අචල අවංකකම , සත්‍යයම ජයගනී, අධර්මයේ වික්‍රමය , තෘප්තියේ රහස නම් ළමා කෙටිකතා දහය මේ ග්‍රන්ථයට ඇතුළත් වී තිබේ.

අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලයෙන්ද පුස්තකාල පොතක් වශයෙන්ද අනුමත කර තිබේ.

ගැටවර මුළාව කුකුල් මස් රස බලා නැති නරියන්ගේ ගැටයට අසුවූ තරුණ කුකුළු කිකිළියන්ට සිදුවූ විනාශය අපූරුවට විස්තර කරයි. දරුවන්ගේ මනදොල සපුරාලන අයුරින් රසවත් , කුතුහලය නංවමින් කතාව ගොඩ නංවා ඇති අයුරු අපූරුය.

මේ කෙටි කතා දහයේම දක්නට ලැබෙන ඉතා සුවිශේෂී ලක්ෂණය ආදර්ශයයි. ළමා චරිත වර්ධනය සඳහා ඉතා වැදගත් මේ ආදර්ශය මගින් ඉටුකළ හැකි මෙහෙවර ඉතා වටනේය. විශේෂයෙන් ළමා පරපුරට එමගින් සිය ජීවිතවලට බොහෝ කරුණු කාරණා එක්කර ගත හැකිය.

සතුරකු උදෙසා කෙටිකතාව මගින් තමන්ට පීඩාකළ අයකුගේ ජීවිතය බේරා ගැනීමට දිවි පුදන චරිතයක් හමුවේ.

මේ බොහෝමයක් කෙටිකතා කතා රසයෙන් පමණක් නොව චරිත වර්ධනයට යොදා ගත හැකි ආදර්ශවත් බවින්ද අනූනය. මේ නිසා ඉන් දරු පරපුරට ලබාගත හැකි ඵල ප්‍රයෝජන ඉමහත්ය.

ස්වර්ගස්ථ වී වදාළ අතිගරු ඩබ්ලිව් . එල්.ජ් දොන් පීටර් මාහිම්පාණන්ගේ ගැටවර මුළාව ළමා කෙටිකතා සංග්‍රහය ඇස්. ගොඩගේ සහ සහෝදර සමාගමේ ප්‍රකාශනයක් ලෙස දැන් නිකුත් වී තිබේ. කිතුනු වටිනාකම් වලින් පිරි ඇති කතා දහයක් ඇති මේ පොත දූ දරුවන් කොයි කාටත් ලබා දිය යුතු මහගු තිළිණයකි.

## මීගමුව සිරිකුරුස දහම් ළමුන්ට ලේඛක වැඩමුළුවක්

මීගමුව, මහවීදිය මීසමට අයත් සිරිකුරුස දහම් පාසලේ ළමුන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් 2012 මැයි මස 13 වන ඉරුදින සිරිකුරුස දෙව් මැඳුරේදී පැවැත්වේ.

9 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ළමුන්ට පැවැත්වෙන මෙය මෙහෙය වනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා විසිනි. මහවීදිය මීසම් සහයක ගරු අරුලානන්දම් උදයදාස් පියතුමාගේ අනුශාසකත්වයෙන් දහම් ගුරු මණ්ඩලය එක්ව මෙය සංවිධානය කරනු ලබයි.

**ශිමානි මල්ෂිකා. (ආචාර්ය මඩුල්ල)**



## පුංචි අපේ චිත්‍ර පිටුව


පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



**මාළු ටැංකියක්**
**නම්ත්මා ජයසිංහ**
04 ශ්‍රේණිය
සිරිකුරුස විදුහල - ගම්පහ

**වැස්ස**
**ශැනන් රන්දේව්**
05 ශ්‍රේණිය
ලොයොලා විදුහල - බෝපිටිය - පමුණුගම



**අපේ ගෙදර**
**නෙහන්සා අමාංගි පීරිස්**
04 ශ්‍රේණිය
ජයලත් අප ස්වාමිදූගේ කන්‍යාරාමය - මොරටුව



**මෝසෙස් තුමා**
**දෙව්තිළිණි පෙරේරා**
07 ශ්‍රේණිය
ශුද්ධවූ ස්නාවක දහම් පාසල
නාගොඩ






**ලස්සන දවසක්**
**පිනිඳි ඔමායා**
01 ශ්‍රේණිය
ආවේ මරියා බාලිකා විදුහල
මීගමුව

**ගොවි මහතෙක්**
**සඳුන් චාමර**
05 ශ්‍රේණිය
සාන්ත මරියා දහම් පාසල
හාල්දඬුවන



**කුරුළු පවුලක්**
**හිමංසලා මල්ෂානි**
02 ශ්‍රේණිය
සිරිහද දහම් පාසල - බොල්ලත - ගණේමුල්ල

**දිය ඇල්ලක්**
**කවිෂා ගයංගි**
06 ශ්‍රේණිය
සියලු සාන්තුවරයන්ගේ බා. විදුහල
බොරැල්ල



## හිතෝපදේශයෙන් පුංචි ඔබට ඔවදනක්

**ආදර දුවේ පුතේ,**

මෙවර ඔබ හා බෙදගන්නට තීරණය කළේ හිතෝපදේශය පොතෙහි සඳහන් 09 වන පරිච්ඡේදයේ 07 වන වගන්තිය යි. ''අහංකාර කෙනෙකුට ඔවා බස්දෙන්නා හට ඇති වන්නේ ලැජ්ජාව පමණිය. දුදනකුට තරවටු කරන්නා හට ඇති වන්නේ සිත් වේදනාව පමණය.''

පුංචි ඔබ ඔබේ දක්ෂතා හැකියාවන් ගැන ආඩම්බර වුවාට ඒ ගැන අහංකාර වන්න එපා. ඔබේ මව පියා ගැන සතුටු වුනාට මාපියන් නැති අයට සමච්චල් කරන්න එපා. ඔබේ පවුලට දෙවිඳුන්ගෙන් බොහෝ දේ ලැබුනද නොලද දු දරුවන් දිහා පහත්කර සලකන්න එපා. එවිට ඔබ අහංකාර චරිතයක් වනු ඇත. ඔබ අහංකාර වුවහොත් කවුරුත් ඔබට කිට්ටු නොවී ඉඳීවි. එවිට ඔබ විසින්ම තනිකරනු ඇත. ඔබ අහංකාර වන විට ඔබට ඔවදන් යහපත් ගුණධර්ම කියා දීමට කවුරුත් ඉදිරිපත් නොවනු ඇත.



**බයිබලයයි පුංචි මමයි**

**ගරු එස්. රන්දිල් ප්‍රනාන්දු (නි.ම.නි) පියතුමන් විසිනි**

අයහපත් ගතිවලින් පිරුණු දුදන අයට අවවාද දීම හා තරවටු කිරිමෙන් ඒ දෙන අයට සිත් වේදනාව ඉතිරි වෙයි.

එසේනම් ඔබත් යහපත් දුවෙක් පුතෙක් කිරීමට ඔබේ මව්පියන් ගුරුවරුන් වැඩිහිටියන් ඔබට දෙන ඔවදන් , අවවාද, මගපෙන්වීම හිතට ගෙන හැදෙන්නට නම් ඔබේ අහංකාර කමට නැවතීම තියන්න.

★ එවිට බොහෝ දෙනෙකු ඔබට ආදරය කරාවි ඔබත් ඔවුනට ආදරය කරන දුවෙක් පුතෙක් වේවි.

★ බොහෝ දෙනකු ඔබට කිට්ටු වේවි. ඔබත් ඔවුනට කිට්ටු වේවි.

★ බොහෝ දෙනෙකු ඔබට සමාව දේවි. ඔබත් ඔවුනට සමාව දේවි.

## බයිබල් දැනුම මිනුමට දස්කම් පෑ කඩලාන සාන්ත අන්තෝනි විදුහල් දරුවෝ



පිළියන්දළ අධ්‍යාපන කලාපයේ මොරටුව අධ්‍යාපන කොට්ඨාශයේ රජයේ පාසල් වල, කතෝලික ධර්මය ඉගෙනුම ලබන දරුවන් අතර දේව වචනයේ වසර වෙනුවෙන් පැවැති බයිබල් දැනුම මිනුම තරගාවලිය පසුගියදා මොරටුව ජනජය විදුහලේ දී පැවැත්විණි. මෙහිදි සාන්ත අන්තෝනි විදුහල් දරුවෝ 6,7,8, හා 9, ශ්‍රේණියෙහි පළමු ස්ථානය හා දෙවන ස්ථානයන්ද 8 ශ්‍රේණියේ ප්‍රථම දෙවන හා තෙවන ස්ථානයන්ද දිනාග නිමින් කැපීපෙනෙන දස්කම් පෑහ.

සමස්ත තරගාවලියේ දෙවැනි වැඩීම ලකුණු ලාභියා වුයේ ද සාන්ත අන්තෝනි විදුහලේ 8 ශ්‍රේණියේ ඉගෙනුම ලබන රසින්ද ප්‍රනාන්දු සිසුවාය. මෙම තරගාවලිය විදුහල වෙනුවෙන් ගරු මිරියම් පැවිදි සොයුරිය හා රුවන්මලි මෙන්දිස් ගුරුතුමිය ළමුන් සූදානම් කළහ. ජයග්‍රාහී ළමුන් ගරු විදුහල්පති තුමිය සහ නි. විදුහල්පතිතුමිය සමග ළමා ප්‍රදීපය කැමරාවට පෙනීසිටි අයුරු මෙහි දැක්වේ.

**රවින්ද්‍ර ජේ.ඇන්ටනි**

## චතාරික ළමා ක්‍රියාකාරකම්

### පන්නිපිටිය ක්‍රිස්තුරාජ විදුහල

පන්නිපිටිය ක්‍රිස්තුරාජ විද්‍යාලයේ වාර්ෂික චතාරික මෙහෙය දිව්‍ය සත්ප්‍රසාද නිකායික ගරු සුදත් ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් පසුගියද විදුහල් භූමියේදී පැවැත්වුණි. විදුහල් භූමිය තුළ පාදනමස්කාරය පවත්වා 12 වැනි ස්ථාන පිළිවෙත ක්‍රිස්තු රජාණන්ගේ දෙව්මැදුරේදී පවත්වන ලදි. ස්වාමින් වහන්සේගේ කුරුසියේ ශක්තිය සාර්ථික ජීවන ගමනක් සඳහා යොදා ගන්නා ආකාරය ගරු සුදත් පියතුමා සිය දෙසුම් වලදී විශේෂයෙන් සිසු දරුවන් දැනුවත් කළේය.


විදුහල්පතිනි ගරු ප්‍රියන්තා ප්‍රනාන්දු සොයුරිය සමග ආගමික අංශය විසින් සංවිධානය කරනු ලැබූ මෙම චතාරික පිළිවෙතට ඇදුරු මඬුල්ල සමග කිතුනු සිසු සිසුවියන් එක් වූහ. **(ක්‍රිස්ටෝපර් රණසිංහ** )



පැල්ලන්දෙනිය සාන්ත අන්තෝනි දේවස්ථානයේ දහම් පාසල් ළමෝ අද සමාජයට ගැලපෙන ආකාරයට අර්ථවත් නාට්‍යානුසාරයෙන් පාද නමස්කාර ස්ථානයන් මෙනෙහි කරමින් රඟ දැක්වූහ. මීසම් සේවක ගරු චන්දන හපුආරච්චි පියතුමාගේ මඟ පෙන්වීමෙන් හා දහම් ගුරුවර ගුරුවරියන්ගේ සංවිධානයෙන් දරු දැරියන්ගේ සහභාගිත්වයෙන් දෙමාපියන්ගේ නොමඳ ආයකත්වයෙන් පැවැත්වුණි. **අනුෂා රුවනි මෙන්ඩිස්**

**දහම් පාසල් හා පාසල් වල දිව බොදුන් ලැබීම් හා සුදතුම් වරම් ලැබීම් ගැන ඔබ එවන සේයාරූ පැහැදිලි විය යුතු අතර සමූහ සේයාරුවක් පමණක් ළමා ප්‍රදීපයේ පළ කෙරෙන බැව් සලකන්න.**
**සංස්කාරක පියතුමා**

## ප්‍රහේලිකා අංක 30



**( සැකසුම - තිළිණි දුතිකා පෙරේරා )**

**හරහට**

1. ''අනුන් විනිශ්චය නොකරන්න. එවිට ඔබත් ............................ කරනු නොලැබේ. යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ වදාල සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

3. නාස්තිකාර පුත්‍රයාගේ උපමාවේ බාල පුතා පසුතැවිලි වී ගෙදර ගිය පසු කරුණාවන්ත පියා ඉතා සංතෝෂ වී ඔහුව පිළිගෙන .......................... කළ වස්සා මරා භෝජන සංග්‍රහයක් පිළියෙල කළේය. හිස්තැනට සුදුසු වචනය

4. ඊශ්‍රායෙල් ජනතාව ගනුදෙනු කරන්නන් රවටන හොර ................... පාවිච්චි කරන බව පවසමින් අමොස් දිවැසිවරයා චෝදනා නැගුවේ ය. හිස්තැනට සුදුසු වචනය

7. දෙවියන් වහන්සේ මෙම දිවැසිවරයාව කැඳවූයේ ඔහු කුඩා කාලයේදීමය.

**පහළට**

1. ක්‍රිස්තුන් වහන්සේ කන්ද උඩ දේශනයේදී සැපත හා ........................... මෙය පිළිබඳව දේශනා කළ සේක.

2. ''මුලා නොවන්න නරක ආශ්‍රයෙන් හොඳ ............................. . නරක් වන්නේස'' යනුවෙන් ශු. පාවුළු තුමා පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. ''මසුන් අල්ලන පිණිස .................... ගොස් දැල් හෙලන්නැ''යි ක්‍රිස්තුන් වහන්සේ සීමොන්ට වදාළ සේක මෙහි හිස්තැනට සුදුසු වචනය

6. ''වත ඉරාගෙන නොව සිත ඉරාගෙන නුඹේ දෙවි සමිඳුන් වෙත හැරී එන්න. ''යනුවෙන් මෙම දිවැසිවරයා තුළින් දෙවියන් වහන්සේ අපට ආරාධනා කරන සේක.

07. ආබ්‍රහම් තුමාගේ බිරිඳගේ නම ................

(මෙම ප්‍රහේලිකාව පිරවීමේදී පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. ලූක් 5/4, 6/37, 6/20, 15/30 , ආමොස් 7/4-6 , 1 සාමුවෙල් 3, උත්පත්ති 18, 1 කොරින්ති 15/ 33, ජෝවෙල් 2/13)


එක දවසක හොඳටම රෑ වෙච්ච වෙලාවක ගඟට ගිහින් වතුර ගේන්න කියල මාම එයාට කිව්වා...
උඹයා.. ගඟට ගිහිං වතුර බාල්දි දෙකක් අරං එනවා.
රුසියානු සුරංගනා කථාවක් ඇසුරෙනි
අනේ මාමෙ මේ මහ රෑ ගඟට යන්නෙ කොහොමද හරිම සීතලයිනෙ
සඳ කුමාරි
කතාව සහ චිත්‍ර..
ඇස්.ඒ.ඊ. සඳුආරච්චි
ලොකු වතුර බාල්දි දෙකක් ඇයට දුන්න මාම.. ගඟ දියමත මිදුන අයිස් තට්ටු කඩා දුන්න කැඩා පොරොවකුත් දුන්නා...
අයිස් තට්ටු කඩාදුන්න මේ පොරොවත් අරං යනවා..
මාමෙ මට පෙරවගන්න කබායක්....
කෑ ගහන්නෙ.. නැතුව කියන දේ කරපං උඹයා... මුරණ්ඩු වෙන්නෙ නැතුව... වතුර ඉවරවෙලා ඉක්මනට... අරං වරෙං...
කැඩා වේරි සීතලේ ගැහි ගැහී ගඟ ළඟට ගියා.
ගඟ දිය මත මිදුන අයිස් තට්ටු කඩල සිදුරක් හාරල බොහොම අමාරුවෙන් බාල්දි දෙකට වතුර පුරවා ගත්තා..
..ඒ වෙලාවේ හිම.. ..වලාවක් ඇදෑ.. ..හැලෙන්න.. ..පටන් ගත්තා...

ශුද්ධ ලියැවිල්ලේ දිවැසිවර චරිතාපදාන ළමා ප්‍රදීපය ඔබ වෙත රැගෙන එයි

අටවන කොටස

# දිවැසිවර එලියා

සැකසුම : හිලිණ අලහකෝන්

